# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2112/32 - 2019 පෙබරවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන.

පැසසුම් සේවා පදක්කම

ස්වස්ති !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වූ ද, රාජ්‍යයේ ප්‍රධානියා වූ ද, විධායකයේ හා ආණ්ඩුවේ ප්‍රධානියා වූ ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක වූ ද, මෛත්‍රීපාල සිරිසේන වන මා විසින්, සියලු දෙනා වෙත සුභාශිංසන පූර්වකව මෙසේ නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවන්හි ස්ථිර හා ස්වේච්ඡා බල හමුදාවන්හි සියලුම නිල දරන්නන් සහ වෙනත් තැනැත්තන් වෙත උපහාර වශයෙන් පැසසුම් සේවා පදක්කමක් ප්‍රදානය කිරීම මාගේ අභිලාෂය වන බැවින්,

එම කාර්ය පාලනය කිරීම සඳහා මින් ඉදිරියට අනුල්ලංඝනීය වශයෙන් පිළිපැදිය යුතු වූ ද, ව්‍යවස්ථා හා රෙගුලාසි දූන් මා විසින් මෙසේ සම්පාදනය කොට නියම කොට සංස්ථාපනය කරනු ලැබේ.

පළමුව : සංඥා නාමය සහ හැඳින්වීම :- මෙම පදක්කම ''පැසසුම් සේවා පදක්කම'' යන නාමයෙන් හැඳින්විය යුතු යැයි නියම කරනු ලැබේ.

දෙවනුව : විස්තරය : - රන්වන් පැහැති ලෝහයෙන්, විශ්කම්භය සෙ. මී. 3.7 ක් වූ පෙති අටකින් යුත් පද්මයක හැඩයට සකස් කළ යුතු මෙම පදක්කමෙහි අභිමුඛ පැත්තේ මැද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නිරූපණය කෙරෙන තුඩු ඉහළට ඇතිව එකිනෙකට හරස් කරන ලද අසිපත් දෙකක් මතු පිට ශ්‍රී ලංකා නාවික හමුදාව නියෝජනය කෙරෙන නැංගුරමක් එය වටේ දම්වැලක් එති ඇති තත්ත්වයෙන් උන්නතව දක්වා එය මතුපිට ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කෙරෙන හිස වමට හරවා ගත් පියාසර කරන රාජාලියෙකු ද, එය වටා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ''පැසසුම් සේවය'' යන පාඨය ද උන්නතව කැටයමින් දැක්විය යුතු ය. ප්‍රතිමුඛ පැත්තේ නෙළුම් මල් පෙති බෝඩරයකින් වට වූ ශ්‍රී ලංකා


1A - G 29554 — 42 (2019/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වංශාවලියේ සංකේත සිංහ රූපයෙන් ද, ඒ වටා දිවෙන වී කරල් මෝස්තරයකින් හා මුදුනේ පිහිටි ධර්ම චක්‍රයෙන් ද, පතුලෙහි පුන්කලසකින් ද, පුන්කලස දකුණු පසින් කිරණ විහිදුවන සූර්යයාගෙන් ද, වම්පසින් චන්ද්‍රයාගෙන් ද සමන්විත වූ ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය ලාංඡනය ද, එයට පහතින් ස්ථාපිත වර්ෂය වන 2009 ද උන්නතව කැටයමින් දක්විය යුතු ය.

තෙවනුව : පීත්ත පටිය :- පීත්ත පටියේ දිග සෙ.මී. 5 ක් ද, පළල සෙ. මී. 3.1 ක් ද, වන අතර, එහි පිළිවෙලින් දකුණුපස සහ වම්පස සෙ. මී. 0.8 ක ලා නිල් පැහැති සහ දීප්තිමත් තද නිල් පැහැති තීරු දෙකකින් ද මැද සෙ.මී. 1.5 ක තද තැඹිලි පැහැති තීරුවකින් යුක්ත විය යුතු අතර, තත් පීත්ත පටිය අවලම්බනය වන සේ සකස් කරන ලද පදක්කම පපුවේ වම් පස පැළඳිය යුතු යැයි නියම කරනු ලැබේ.

සිව්වනුව : සුදුසුකම් :- 2009.05.19 දින සිට පශ්චාත් යුධ ක්‍රියාකාරකම් සඳහා දායක වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂක රාජ්‍ය ඇමති, ආරක්ෂක ලේකම්වරයාට සහ මූලික පුහුණු පාඨමාලා කාලසීමාව හැර වසර හයකට නොඅඩු ගණනීය සේවා කාලයක් සපුරා ඇති හැසිරීම හා පැවැත්ම සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවන්හි ස්ථිර සහ ස්වේච්ඡා බල හමුදාවන්හි සියලු නිල දරන්නන් හට ද, සන්නද්ධ සේවාවන්හි වසර හයක ගණනීය සේවා කාලයක් සහිත ස්ථිර සිවිල් සේවකයන් හට ද, මෙහි මින් මතු සම්පාදනය කොට දක්වෙන කොන්දේසිවලට යටත්ව මෙම පළඳනාව පිරිනැමිය යුතු යැයි නියම කරනු ලැබේ.

පස්වනුව : ලියාපදිංචි කිරීම :- අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියෙන් පසු පදක්කම පිරිනමනු ලැබ ඇති සියලු අයගේ නම්, අදාළ සේවා නියෝගයන්හි පළ කළ යුතු යැයි ද, අදාළ සන්නද්ධ සේවාධිපතීන්ගේ විධානය යටතේ එම අයගේ නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු යැයි ද නියම කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂ රාජ්‍ය ඇමති සහ ආරක්ෂක ලේකම්වරයා සම්බන්ධයෙන් එවැනි නාමලේඛනයක් ආරක්ෂක අමාත්‍යාංශයේ විධානය යටතේ පවත්වාගෙන යා යුතු යැයි ද නියම කරනු ලැබේ.

සයවනුව : පැළඳීමේ අනුපිළිවෙල :- ප්‍රසාධනා පළඳනා සහ පදක්කම් පැළඳිය යුතු අනුපිළිවෙල දක්වෙන නිල ලේඛනය අනුව සන්නද්ධ සේවා දීර්ඝ සේවා පදක්කමට ඉක්බිතිව පැසසුම් සේවා පදක්කම පැළඳිය යුතු යැයි නියම කරනු ලැබේ.

සත්වනුව : කුඩා අනුරූප :- පදක්කම්ලාභීන් විසින් ඇතැම් අවස්ථාවන් හී දී පළඳිනු ලබන්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පදක්කම් යනුවෙන් හැඳින්වෙන්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පදක්කමේ ප්‍රමාණය, ප්‍රදානය කර ඇති පදක්කමේ ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් අර්ධයක් තරම් විය යුතු අතර, එම කුඩා අනුරූපයේ මුද්‍රා තැබූ ආදර්ශකයක්, සේවා මූලස්ථානවල තැන්පත් කර තිබිය යුතු යැයි නියම කරනු ලැබේ.

අටවනුව : අහිමි කිරීම හා නැවත හිමිකර දීම :- මෙහි මින් මතු පනවනු ලබන රෙගුලාසි යටතේ, යම්කිසි පුද්ගලයෙකු වෙත ප්‍රදානය කරනු ලැබ ඇති පදක්කමක් අවලංගු කර නිෂ්ප්‍රභා කිරීමට අතිගරු ජනාධිපතිතුමාට හැකි බවට ද, නමුත් එසේ අහිමි කරනු ලැබූ ප්‍රදානයක් යළිත් වලංගු කර ලබාදීමට ද, එතුමාට නීත්‍යානුකූලව බලය ඇති බවට ද, නියම කරනු ලැබේ. අවලංගු කිරීමේ හෝ යළිත් ලබා දීමේ නිවේදනය සෑම අවස්ථාවකදීම අදාළ සේවා නියෝගවල පළ කළ යුතු වේ.

නවවනුව : ක්‍රියාත්මක වන දිනය :- මෙම පදක්කම 2009 මැයි මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ දෙදහස් දහනවයක් වූ පෙබරවාරි මස 21 වන දින කොළඹ ජනාධිපති මන්දිරයේ දී නිකුත් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

## පැසසුම් සේවා පදක්කම

ජනාධිපති බලපත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට විස්තර වශයෙන් පැසසුම් සේවා පදක්කම පිරිනැමීමට, අහිමි කිරීමට, පෙරළා හිමිකර දීමට සහ ඒ සම්බන්ධ වෙනත් කරුණුවලට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් පනවන ලද රෙගුලාසි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

2019 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ,
ජනාධිපති ලේකම් කාර්යාලයේ දී ය.

## පැසසුම් සේවා පදක්කම

1. දෙදහස් නවය වසරේ මැයි මස දහනව වන දින සිට පශ්චාත් යුධ ක්‍රියාකාරකම් සඳහා දායක වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂක රාජ්‍ය ඇමති, ආරක්ෂක ලේකම්වරයා සහ හැසිරීම හා පැවැත්ම පිළිබඳ සෑහීමකට පත්වන්නා වූ ද, දෙදහස් නවය වසරේ මැයි මස දහනව වනදා වන විට සක්‍රීය සේවයේ යෙදී සිටි සහ ඉන් පසු සේවයට එක් වූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවන්හි නිත්‍ය සහ ස්වේච්ඡා බලසේනාවන්ට අයත් වූ ද, මූලික පුහුණු පාඨමාලාව හැර වසර හයක ගණනීය සේවා කාලයක් සපුරන්නා වූ කවර තරාතිරමකට අයත් කෙනෙකු මෙන්ම සන්නද්ධ සේවාවන්හි වසර හයක ගණනීය සේවා කාලයක් සහිත ස්ථිර සිවිල් සේවකයන් ද, පැසසුම් සේවා පදක්කම ලැබීමට සුදුසු වන්නේ ය.

2. දෙදහස් නවය වසරේ මැයි මස දහනව වන දා සිට වසර හයක් සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාමලත්, සේවයෙන් පහ කරන ලද හෝ සේවයෙන් ඉල්ලා අස් වූ අයවළුන් මෙම පදක්කම සඳහා හිමිකම් නොලබන්නේ ය.

3. මියගිය තැනැත්තෙකු වෙනුවෙන් කෙරෙන ප්‍රදානය, ප්‍රදානලාභියාගේ නීත්‍යානුකූල ළඟ ම ඥාතියා විසින් හෝ එම ළඟම ඥාතියා විසින් නම් කරනු ලබන තැනැත්තෙකු විසින් භාරගනු ලැබිය හැකි ය.

4. පැසසුම් සේවා පදක්කම ප්‍රදානය කිරීම සඳහා කරනු ලැබ ඇති නිර්දේශ සන්නද්ධ සේවාධිපති විසින් නම් කරනු ලබන තිදෙනෙකුට නොඅඩු ගණනකින් සමන්විත මණ්ඩලයක් විසින් පරීක්ෂණයට භාජනය කළ යුතු ය. එම මණ්ඩලය විසින් කරනු ලබන නිර්දේශ අදාළ සන්නද්ධ සේවාධිපතිගේ නිර්දේශ ද සමග ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මගින් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂක රාජ්‍ය ඇමති සහ ආරක්ෂක ලේකම්වරයා සම්බන්ධයෙන් නිර්දේශ ඉඳුරාම ආරක්ෂක ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ යුතු ය.

5. සෑම නිර්දේශයක් සමගම නිර්දේශිත පුද්ගලයාගේ අංකය, නිලය, නම හා සම්පූර්ණ නම ඇතුළු අනෙකුත් අදළ සියලු තොරතුරු ද, ඉදිරිපත් කළ යුතු ය.

6. පදක්කම පිරිනමනු ලැබූ අයගේ නම් අදළ සේවා නියෝගවල පළ කළ යුතු ය. එම පදක්කම්ලාභීන් සියලු දෙනාගේ ම නාමලේඛනයක් අදාළ සන්නද්ධ සේවාධිපතිගේ විධානය යටතේ පවත්වාගෙන යා යුතු ය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂක රාජ්‍ය ඇමති සහ ආරක්ෂක ලේකම්වරයා සම්බන්ධයෙන් එවැනි නාමලේඛනයක් ආරක්ෂක අමාත්‍යාංශයේ විධානය යටතේ පවත්වාගෙන යා යුතු ය.

7. පදක්කම පිරිනමනු ලැබ සිටින අයෙකු යුද්ධාධිකරණ තීන්දුවක් අනුව හෝ වෙනත් අධිකරණ තීන්දුවක් අනුව හෝ මරණ දණ්ඩනයකට යටත් වුවහොත් එවිට ''අතිගරු ජනාධිපතිතුමා විසින් මීට වෙනස් අන්දමක නියෝගයක් නොකරනු ලැබුවහොත් '' එම පදක්කම ඔහුට අහිමි විය යුත්තේ ය.

8. සේවාවලින් නෙරපා හරිනු ලබන සහ පහ කරනු ලබන හෝ අධිකාරියන් ඉල්ලා අස්වීමට හෝ විශ්‍රාම ගැනීමට නියම කරනු ලබන සෑම නිලධාරියෙකුටම අතිගරු ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් නොකරනතාක් ඔහු වෙත ප්‍රදනය කරනු ලැබ ඇති පදක්කම අහිමි විය යුත්තේ ය.

9. නින්ද සහගතව නොහොත් අපකීර්ති සහගතව සේවාවලින් අස් කරනු ලබන හමුද සාමාජිකයෙකුටම අතිගරු ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් කරනතාක් ඔහු වෙත ප්‍රදනය කරන ලද පදක්කම අහිමි විය යුත්තේ ය.

10. පදක්කම ප්‍රදනය කරනු ලැබ සිටින තැනැත්තෙක්, රාජ්‍ය ද්‍රෝහිකම, රාජ්‍ය භේදය, කැරලි ගැසීම, බියසුළුකම, සේවය අතහැර යාම හෝ අස්වාභාවික අන්දමේ නින්දනීය හැසිරීම් වැනි වරදකට වරදකරු වූයේ නම්, හෝ විෂමචාරය නිසා සේවයෙන් පහ කරනු හෝ අස් කරනු ලැබුවේ නම් හෝ සේවාවේ නීතියට යටත්ව සිටියදී සිවිල් බලධාරීන් විසින් වරදකරුවෙකු කරනු ලැබුවේ නම්, එවිට අතිගරු ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් නොකරනතාක්, ඔහුට ප්‍රදනය කරන ලද පදක්කම අහිමි විය යුත්තේ ය.

11. ඕනෑම පුද්ගලයෙකුට අහිමි වූ පදක්කම ස්වකීය අභිමතය පරිදි පෙරළා හිමි කර දීමට අතිගරු ජනාධිපතිතුමාට හැකිය.

12. අහිමි කිරීමක් හෝ පෙරළා හිමිකර දීමක් සිදුවන සෑම අවස්ථාවකදීම ඒ පිළිබඳව නිවේදනයක් අදළ සේවා නියෝගවල පළ කළ යුතු ය.

13. නැති වූ පදක්කමක් වෙනුවට නව පදක්කමක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් එම නැතිවීම පිළිබඳව පොලිසියට දන්වා සිටිය යුතු ය. එය නැතිවූයේ කවර තත්ත්වයක් යටතේ ද යන්න ගැන සාම විනිසුරුවරයෙකු විසින් සහතික කරන ලද ප්‍රකාශයක් පොලිසියට කරන ලද පැමිණිල්ල සමඟ සිය අණදෙන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඔහු විසින් එය ලිපි ගනුදෙනු කරන සාමාන්‍ය මාර්ගය ඔස්සේ අදළ සන්නද්ධ සේවාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. නැතිවීම සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු සතුටුදායක බව පිළිගනු ලැබුවහොත්, නැති වූ පදක්කම වෙනුවට නව පදක්කමක් මුදල් ගෙවා ලබා ගත හැකිය.

14. මෙම රෙගුලාසිවල ඃ-

| | | | |
|---|---|---|---|
| (අ) | ''සේවා'' යන්නෙන් | - | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව<br>ශ්‍රී ලංකා නාවික හමුදාව<br>ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| (ආ) | ''සන්නද්ධ සේවාධිපතීන්'' යන්නෙන් | - | යුද්ධ හමුදාධිපති<br>නාවික හමුදාධිපති සහ<br>ගුවන් හමුදාධිපති ද, |
| (ඇ) | ''හමුදා සාමාජික'' යන්නෙන් | - | යුද්ධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදා සාමාජිකයින් |
| (ඈ) | ''සිවිල් සේවකයන් '' යන්නෙන් | - | යුද්ධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදාවන්හි සේවයේ නියුතු සිවිල් සේවක සේවිකාවන් |
| (ඉ) | ''යුද්ධ හමුදාව'' යන්නෙන් | - | ශ්‍රී ලංකා යුද්ධ හමුදාවද |
| (ඊ) | ''නාවික හමුදාව'' යන්නෙන් | - | ශ්‍රී ලංකා නාවික හමුදාවද |
| (උ) | ''ගුවන් හමුදාව'' යන්නෙන් | - | ශ්‍රී ලංකා ගුවන් හමුදාවද |

03 - 772/1

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

සේවා පදක්කම

ස්වස්ති !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වූ ද, රාජ්‍යයේ ප්‍රධානියා වූ ද, විධායකයේ හා ආණ්ඩුවේ ප්‍රධානියා වූ ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක වූ ද, මෛත්‍රීපාල සිරිසේන වන මා විසින්, සියලු දෙනා වෙත සුභාශිංසන පූර්වකව මෙසේ නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවන්හි ස්ථිර හා ස්වේච්ඡා බල හමුදාවන්හි සියලුම නිල දරන්නන් සහ වෙනත් තැනැත්තන් වෙත උපහාර වශයෙන් සේවා පදක්කමක් ප්‍රදානය කිරීම මාගේ අභිලාෂය වන බැවින්,

එම කාර්ය පාලනය කිරීම සඳහා මින් ඉදිරියට අනුල්ලංඝනීය වශයෙන් පිළිපැදිය යුතු වූ ද, ව්‍යවස්ථා හා රෙගුලාසි දැන් මා විසින් මෙසේ සම්පාදනය කොට නියම කොට සංස්ථාපනය කරනු ලැබේ.

පළමුව : සංඥා නාමය සහ හැඳින්වීම :- මෙම පදක්කම ''සේවා පදක්කම'' යන නාමයෙන් හැඳින්විය යුතු යැයි නියම කරනු ලැබේ.

දෙවනුව : විස්තරය : - රෝස රන්වන් පැහැති ලෝහයෙන්, එක් පාදයක දිග සෙ. මී. 2.2ක් වූ සතරකොණ වක්‍රාකාර සමචතුරස්‍රයක හැඩයෙන් සකස් කළ යුතු මෙම පදක්කමෙහි අභිමුඛ පැත්තේ මැද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නිරූපණය කෙරෙන තුඩු ඉහළට ඇතිව එකිනෙකට හරස් කරන ලද අසිපත් දෙකක් මතු පිට ශ්‍රී ලංකා නාවික හමුදාව නියෝජනය කෙරෙන නැංගුරමක් එය වටේ දම්වැලක් එතී ඇති තත්ත්වයෙන් උන්නතව දක්වා එය මතුපිට ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කෙරෙන හිස වමට හරවා ගත් පියාසර කරන රාජාලියෙකු ද, එයට පහතින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ''සේවා පදක්කම'' යන පාඨය ද උන්නතව කැටයමින් දැක්විය යුතු ය. ප්‍රතිමුඛ පැත්තේ මැද නෙළුම් මල් පෙති බෝඩරයකින් වට වූ ශ්‍රී ලංකා වංශාවලියේ සංකේත සිංහ රූපයෙන් ද, ඒ වටා දිවෙන වී කරල් මෝස්තරයකින් හා මුදුනේ පිහිටි ධර්ම චක්‍රයෙන් ද, පතුලෙහි පුන්කලසකින් ද, පුන්කලස දකුණු පසින් කිරණ විහිදුවන සූර්යයාගෙන් ද, වම්පසින් චන්ද්‍රයාගෙන් ද සමන්විත වූ ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය ලාංඡනය ද, එයට පහතින් ස්ථාපිත වර්ෂය වන 2009 ද උන්නතව නිරූපනය කර තිබිය යුතු යැයි නියම කරනු ලැබේ.

තෙවනුව : පීත්ත පටිය :- දෙපසින් සෙ. මී. 0.8ක තද නිල් පැහැති තීරු දෙකකින් ද, මැද සෙ. මී. 1.5ක දීප්තිමත් කොළ පැහැති තීරුවකින් ද යුක්තව පළලින් සෙ. මී. 3.1කින් ද, දිගින් සෙ. මී. 5කින් ද යුත් පීත්ත පටියකින් අවලම්බනය වන සේ සකස් කරන ලද පදක්කම පපුවේ වම් පස පැළඳිය යුතු යැයි නියම කරනු ලැබේ.

සිව්වනුව : සුදුසුකම් :- 2009.05.19 දින සිට පශ්චාත් යුධ ක්‍රියාකාරකම් සඳහා දායක වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂක රාජ්‍ය ඇමති, ආරක්ෂක ලේකම්වරයාට සහ මූලික පුහුණු පාඨමාලා කාලය හැර වසර තුනකට නොඅඩු ගණනීය සේවා කාලයක් සපුරා ඇති හැසිරීම සහ පැවැත්ම සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවන්හි ස්ථිර සහ ස්වේච්ඡා බල හමුදාවන්හි සියලු නිල දරන්නන් හට ද, සන්නද්ධ සේවාවන්හි වසර තුනක ගණනීය සේවා කාලයක් සහිත ස්ථිර සිවිල් සේවකයන් හට ද, මෙහි මින් මතු සම්පාදනය කොට දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙම පළඳනාව පිරිනැමිය යුතු යැයි නියම කරනු ලැබේ.

පස්වනුව : ලියාපදිංචි කිරීම :- අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියෙන් පසු පදක්කම පිරිනමනු ලැබ ඇති සියලු අයගේ නම්, අදාළ සේවා නියෝගයන්හි පළ කළ යුතු යැයි ද, අදාළ සන්නද්ධ සේවාධිපතීන්ගේ විධානය යටතේ, එම අයගේ නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු යැයි ද නියම කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂක රාජ්‍ය ඇමති සහ ආරක්ෂක ලේකම්වරයා සම්බන්ධයෙන් එවැනි නාමලේඛනයක් ආරක්ෂක අමාත්‍යාංශයේ විධානය යටතේ පවත්වාගෙන යා යුතු යැයි ද නියම කරනු ලැබේ.

| | | |
|---|---|---|
| සයවනුව | : | පැළඳීමේ අනුපිළිවෙල :- ප්‍රසාධනා පළඳනා සහ පදක්කම් පැළඳිය යුතු අනුපිළිවෙල දැක්වෙන නිල ලේඛනය අනුව පැසසුම් සේවා පදක්කමට ඉක්බිතිව මෙම සේවා පදක්කම පැළඳිය යුතු යැයි නියම කරනු ලැබේ. |
| සත්වනුව | : | කුඩා අනුරූප :- පදක්කම්ලාභීන් විසින් ඇතැම් අවස්ථාවන් හී දී පළඳිනු ලබන්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පදක්කම් යනුවෙන් හැඳින්වෙන්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පදක්කමේ ප්‍රමාණය, ප්‍රදානය කර ඇති පදක්කමේ ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් අර්ධයක් තරම් විය යුතු අතර, එම කුඩා අනුරූපයේ මුද්‍රා තැබූ ආදර්ශකයක්, සේවා මූලස්ථානවල තැන්පත් කර තිබිය යුතු යැයි නියම කරනු ලැබේ. |
| අටවනුව | : | අහිමි කිරීම හා නැවත හිමිකර දීම :- මෙහි මින් මතු පනවනු ලබන රෙගුලාසි යටතේ, යම්කිසි පුද්ගලයෙකු වෙත ප්‍රදානය කරනු ලැබ ඇති පදක්කමක් අවලංගු කර නිෂ්ප්‍රභා කිරීමට අතිගරු ජනාධිපතිතුමාට හැකි බවට ද, නමුත් එසේ අහිමි කරනු ලැබූ ප්‍රදානයක් යළිත් වලංගු කර ලබාදීමට ද, එතුමාට නීත්‍යානුකූලව බලය ඇති බවට ද, නියම කරනු ලැබේ. අවලංගු කිරීමේ හෝ යළිත් ලබා දීමේ නිවේදනය සෑම අවස්ථාවකදීම අදාළ සේවා නියෝගවල පළ කළ යුතු වේ. |
| නවවනුව | : | ක්‍රියාත්මක වන දිනය :- මෙම පදක්කම 2009 මැයි මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේ ය. |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහනවයක් වූ පෙබරවාරි මස 21 වැනි දින කොළඹ ජනාධිපති මන්දිරයේ දී නිකුත් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

**සේවා පදක්කම**

ජනාධිපති බලපත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට විස්තර වශයෙන්ද සේවා පදක්කම පිරිනැමීමට, අහිමි කිරීමට, පෙරළා හිමිකර දීමට සහ ඒ සම්බන්ධ වෙනත් කරුණුවලට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් පනවන ලද රෙගුලාසි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

2019 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ,
ජනාධිපති ලේකම් කාර්යාලයේ දී ය.

සේවා පදක්කම

1. දෙදහස් නවය වසරේ මැයි මස දහනව වන දින සිට පශ්චාත් යුධ ක්‍රියාකාරකම් සඳහා දායක වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂක රාජ්‍ය ඇමති, ආරක්ෂක ලේකම්වරයා සහ හැසිරීම හා පැවැත්ම පිළිබඳ සෑහීමකට පත්වන්නා වූ ද, දෙදහස් නවය වසරේ මැයි මස දහනව වනදා වන විට සක්‍රීය සේවයේ යෙදී සිටි සහ ඉන් පසු සේවයට එක් වූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවන්හි නිත්‍ය සහ ස්වේච්ඡා බළසේවාවන්ට අයත් වූ ද, මූලික පුහුණු පාඨමාලාව හැර වසර තුනක ගණනීය සේවා කාලයක් සපුරන්නා වූ කවර තරාතිරමකට අයත් කෙනෙකු මෙන්ම සන්නද්ධ සේවාවන්හි වසර තුනක ගණනීය සේවා කාලයක් සහිත ස්ථිර සිවිල් සේවකයන් ද, සේවා පදක්කම ලැබීමට සුදුසු වන්නේ ය.

2. දෙදහස් නවය වසරේ මැයි මස දහනව වන දා සිට වසර තුනක් සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාමලත්, සේවයෙන් පහ කරන ලද හෝ සේවයෙන් ඉල්ලා අස් වූ අයවළුන් මෙම පදක්කම සඳහා හිමිකම් නොලබන්නේ ය.

3. මියගිය තැනැත්තෙකු වෙනුවෙන් කෙරෙන ප්‍රදානය, ප්‍රදානලාභියාගේ නීත්‍යානුකූල ළඟ ම ඥාතියා විසින් හෝ එම ළඟම ඥාතියා විසින් නම් කරනු ලබන තැනැත්තෙකු විසින් භාරගනු ලැබිය හැකි ය.

4. සේවා පදක්කම ප්‍රදනය කිරීම සඳහා කරනු ලැබ ඇති නිර්දේශ සන්නද්ධ සේවාධිපති විසින් නම් කරනු ලබන තිදෙනෙකුට නොඅඩු ගණනකින් සමන්විත මණ්ඩලයක් විසින් පරීක්ෂණයට භාජනය කළ යුතු ය. එම මණ්ඩලය විසින් කරනු ලබන නිර්දේශ අදළ සන්නද්ධ සේවාධිපතිගේ නිර්දේශ ද සමඟ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මගින් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂක රාජ්‍ය ඇමති සහ ආරක්ෂක ලේකම්වරයා සම්බන්ධයෙන් නිර්දේශ ඉදුරාම ආරක්ෂක ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ යුතු ය.

5. සෑම නිර්දේශයක් සමගම නිර්දේශිත පුද්ගලයාගේ අංකය, නිලය, නම හා සම්පූර්ණ නම ඇතුළු අනෙකුත් අදළ සියලු තොරතුරු ද ඉදිරිපත් කළ යුතු ය.

6. පදක්කම පිරිනමනු ලැබූ අයගේ නම් අදළ සේවා නියෝගවල පළ කළ යුතු ය. එම පදක්කම්ලාභීන් සියලු දෙනාගේ ම නාමලේඛනයක් අදාළ සන්නද්ධ සේවාධිපතිගේ විධානය යටතේ පවත්වාගෙන යා යුතු ය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක ඇමති, ආරක්ෂක රාජ්‍ය ඇමති සහ ආරක්ෂක ලේකම්වරයා සම්බන්ධයෙන් එවැනි නාමලේඛනයක් ආරක්ෂක අමාත්‍යාංශයේ විධානය යටතේ පවත්වාගෙන යා යුතු ය.

7. පදක්කම පිරිනමනු ලැබ සිටින අයෙකු යුද්ධාධිකරණ තීන්දුවක් අනුව හෝ වෙනත් අධිකරණ තීන්දුවක් අනුව හෝ මරණ දණ්ඩනයකට යටත් වුවහොත් එවිට ''හෝ අතිගරු ජනාධිපතිතුමා විසින් මීට වෙනස් අන්දමක නියෝගයක් නොකරනු ලැබුවහොත් '' එම පදක්කම ඔහුට අහිමි විය යුත්තේ ය.

8. සේවාවලින් නෙරපා හරිනු ලබන සහ පහ කරනු ලබන හෝ අධිකාරියෙන් ඉල්ලා අස්වීමට හෝ විශ්‍රාම ගැනීමට නියම කරනු ලබන සෑම නිලධාරියෙකුටම අතිගරු ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් නොකරනතාක් ඔහු වෙත ප්‍රදනය කරනු ලැබ ඇති පදක්කම අහිමි විය යුත්තේ ය.

9. නින්ද සහගතව නොහොත් අපකීර්ති සහගතව සේවාවෙන් අස් කරනු ලබන සෑම හමුද සාමාජිකයෙකුටම අතිගරු ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් කරනතාක් ඔහු වෙත ප්‍රදනය කරන ලද පදක්කම අහිමි විය යුත්තේ ය.

10. පදක්කම ප්‍රදානය කරනු ලැබ සිටින තැනැත්තෙක්, රාජ්‍ය ද්‍රෝහිකම, රාජ්‍ය භේදය, කැරලි ගැසීම, බියසුළුකම, සේවය අතහැර යාම හෝ අස්වාභාවික අන්දමේ නින්දනීය හැසිරීම් වැනි වරදකට වරදකරු වූයේ නම්, හෝ විෂමචාරය නිසා සේවයෙන් පහ කරනු හෝ අස් කරනු ලැබුවේ නම් සේවාවේ නීතියට යටත්ව සිටිය දී සිවිල් බලධාරීන් විසින් වරදකරුවෙකු කරනු ලැබුවේ නම්, එවිට අතිගරු ජනාධිපතිතුමා විසින් මීට වෙනස් ආකාරයක නියෝගයක් නොකරනතාක්, ඔහුට ප්‍රදනය කරන ලද පදක්කම අහිමි විය යුත්තේ ය.

11. ඕනෑම පුද්ගලයෙකුට අහිමි වූ පදක්කම ස්වකීය අභිමතය පරිදි පෙරළා හිමි කර දීමට අතිගරු ජනාධිපතිතුමාට හැකිය.

12. අහිමි කිරීමක් හෝ පෙරළා හිමිකර දීමක් සිදුවන සෑම අවස්ථාවකදීම ඒ පිළිබඳව නිවේදනයක් අදළ සේවා නියෝගවල පළ කළ යුතු ය.

13. නැති වූ පදක්කමක් වෙනුවට නව පදක්කමක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් එම නැතිවීම පිළිබඳව පොලීසියට දන්වා සිටිය යුතු ය. එය නැතිවූයේ කවර තත්ත්වයක් යටතේ ද යන්න ගැන සාම විනිසුරුවරයෙකු විසින් සහතික කරන ලද ප්‍රකාශයක් පොලීසියට කරන ලද පැමිණිල්ල සමඟ සිය අණදෙන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඔහු විසින් එය ලිපි ගනුදෙනු කරන සාමාන්‍ය මාර්ගය ඔස්සේ අදළ සන්නද්ධ සේවාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. නැතිවීම සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු සාධාරණ බව පිළිගනු ලැබුවහොත්, නැති වූ පදක්කම වෙනුවට නව පදක්කමක් මුදල් ගෙවා ලබා ගත හැකිය.

14. මෙම රෙගුලාසිවල ඃ-

| | | | |
|---|---|---|---|
| (අ) | ''සේවා'' යන්නෙන් | - | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව<br>ශ්‍රී ලංකා නාවික හමුදාව<br>ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| (ආ) | ''සන්නද්ධ සේවාධිපතීන්'' යන්නෙන් | - | යුද්ධ හමුදාධිපති<br>නාවික හමුදාධිපති සහ,<br>ගුවන් හමුදාධිපති ද, |
| (ඇ) | ''හමුදා සාමාජික'' යන්නෙන් | - | යුද්ධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදා සාමාජිකයින් |
| (ඈ) | ''සිවිල් සේවකයන් '' යන්නෙන් | - | යුද්ධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදාවන්හි සේවයේ නියුතු සිවිල් සේවක සේවිකාවන් |
| (ඉ) | ''යුද්ධ හමුදාව'' යන්නෙන් | - | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ද, |
| (ඊ) | ''නාවික හමුදාව'' යන්නෙන් | - | ශ්‍රී ලංකා නාවික හමුදාව ද, |
| (උ) | ''ගුවන් හමුදාව'' යන්නෙන් | - | ශ්‍රී ලංකා ගුවන් හමුදාව ද, |

03 - 772/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.